# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2184/53 - 2020 ජූලි මස 18 වැනි සෙනසුරාදා - 2020.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 ජූලි මස 19 වැනි දින සිට ආරම්භ වන මාස 06 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 ජූලි මස 18 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩය | | | | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 01 | 03.05 | 0305.59.10 | උම්බලකඩ සහ ඒ සඳහා ආදේශක | කි.ග්‍රෑමයකට රු. 102 |
| 02 | 04.06 | 0406.20 | සියළුම වර්ගවල පෙරන් ගාන ලද හෝ පිටි කරන ලද කේජු | කි.ග්‍රෑමයකට රු. 200 |
| 03 | 09.09 | 0909.21 | කොත්තමල්ලි බීජ - කුඩු නොකළ හා නොඇඹරූ | කි.ග්‍රෑමයකට රු. 26 |
| | | 0909.22 | කොත්තමල්ලි බීජ - කුඩු කළ හෝ ඇඹරූ | කි.ග්‍රෑමයකට රු. 52 |
| 04 | 09.10 | 0910.30.10 | කහ - කුඩු නොකළ හා නොඇඹරූ | කි.ග්‍රෑමයකට රු. 102 |
| | | 0910.30.90 | කහ - අනෙකුත් | කි.ග්‍රෑමයකට රු. 360 |
| 05 | 11.06 | 1106.10.10 | උඳු පිටි | කි.ග්‍රෑමයකට රු. 325 |

08 - 38

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.